දිවි තොර කරගැනීම් සැබවින්ම වසංගතයක් ලෙසින් පැතිර යෑමේ ඉඩකඩක් තිබේ. එයට දිවි තොර කරගැනීම් සම්බන්ධයෙන් වන පුවත් වාර්තාවන්ද හේතු වීමේ ඉඩක් තිබේ. එනිසාම, දිවි තොර කරගැනීම් පිළිබඳව වාර්තා කිරීමේදී ආචාර ධාර්මික සහ ප්‍රවේසම් සහගත ප්‍රවේශයක් අත්‍යාවශ්‍ය වෙයි. කෙසේ නමුත්, බොහෝ විට මාධ්‍ය තුළ දිවි තොරකරගැනීම් වාර්තාකරණය සඳහා හඳුන්වා දී ඇති මාධ්‍ය ආචාර ධර්ම පිළිනොපැදීමද කණගාටුවට කරුණකි.

පහත පුවත් වාර්තාවන් ඊට උදාහරණ වේ.

පුවත් වාර්තාවක දිවි තොර කරගත් ආකාරය සඳහන් කිරීම ඔස්සේ, එම ආකාරය තවත් අයෙකු අනුකරණය කිරීමේ හැකියාවක් තිබේ. එසේම දිවි තොර කරගැනීමේ හේතුව සරලව දැක්වීම ඔස්සේ, එය ඊට සමාන ගැටළුවක සිටින අයෙකු තමන් වෙත අනන්‍ය කරගැනීමත්, ඒ ඔස්සේ එය දිවි තොර කරගැනීම් සඳහා උත්ප්‍රේරකයක් වීමත් සිදුවිය හැක.

මීට අමතරව උපකාරක අංක සඳහන් කිරීම දිවි අහිමි කරගැනීම් වාර්තාකරණය සඳහා අත්‍යාවශ්‍ය වන්නේ, ඒ ඔස්සේ දිවි අහිමි කරගැනීමේ නැඹුරුවක් ඇති තවත් අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට ඉඩක් තිබෙන නිසායි.

මූලාශ්‍ර:

https://media.samaritans.org/.../Samaritans_Media...

https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina #Mawbima**